# Sri Lanka Association of Meteorologists

**(Regd. No. 4327)**

Hony. President : ***Mr.Malith Fernando***
Hony. Gen. Secretary: ***Mr. S. Wickramasuriya***
Hony. Asst. Secretary: ***Ms. C. G. Premachandra***

Department of Meteorology
383, Bauddhaloka Mawatha
Colombo 7.

Telephone: **011 2252721, 070 3753311, Fax**: **011 2252319**


---

**<u>මාධ්‍ය නිවේදනය.</u>**

"දිත්වා" සුළිකුණාටු තත්ත්වය හේතුවෙන් ජීවිත අහිමිවූ, අබාධයන්ට ලක්වූ සහ දේපොළ හානිවූ සියලුම ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් ශ්‍රී ලංකා කාලගුණ විද්‍යාඥයින්ගේ සංගමය ලෙස අපගේ ඉමහත් ශෝකය පළකරමු!

පැවති අපදා තත්ත්වය හමුවේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් නිවැරදි නොවන තොරතුරු විශාල ප්‍රමාණයක් සංසරණය වනු දැකිය හැකි විය. එවැනි අසත්‍ය තොරතුරු මගින් හානි වනුයේ ජනතාව වෙනුවෙන්, පෙර දැනුම්දීම් හරහා ජන ජීවිතය සුරක්ෂිත කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති මෙම ආයතනයේ විශ්වසනීයත්වයයි. "දිත්වා" සුළිකුණාටුවේ මූලික අවස්ථාවේ සිට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ (National Meteorological Center - NMC) සේවයේ නියුතු කාලගුණ විද්‍යාඥයින් ඇතුළු නිලධාරීන් විසින් ඉටුකරන ලද කාර්යයන් සම්බන්ධව දැනුවත් කිරීම වෙනුවෙන් මෙම දීර්ඝ ලිපිය සකසන ලද අතර නිවැරදි තොරතුරු ජනගත කිරීම වෙනුවෙන් මෙම නිවේදනය සඳහා ඔබ ආයතනයේ ගුවන් කාලයෙන් ඉඩක් වෙන්කරන මෙන් ඉල්ලා සිටිමු.

දීර්ඝ කාලීන දත්ත අනුව නොවැම්බර් යනු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ සුළිකුණාටු අවදානම වැඩි මාසයකි. 2025 නොවැම්බර් මින් වෙනස් නොවූ වඩාත් සංකීර්ණ කාලගුණික තත්ත්වයන්ගෙන් යුක්තවූ මාසයක් වන අතර දිවයින ආශ්‍රිතව සහ බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ හටගත් ප්‍රධාන කාලගුණික පද්ධති තුනක බලපෑම නිරීක්ෂණය විණි. මින් ප්‍රථම පද්ධතිය අඩුපීඩන කලාපය තෙක් පමණක් වර්ධනය වූ අතර අනෙක් පද්ධති දෙක, "සෙන්යා" සහ "දිත්වා" ලෙස නම් කරනු ලැබූ සුළිකුණාටු බවට වර්ධනය විය. මෙම පද්ධති ත්‍රිත්වයෙන් දිත්වා සුළිකුණාටුව විසින් දිවයිනේ සාමාන්‍ය ජනජීවිතයට සහ දේපොළවලට සිදුවූ බලපෑම අතිශය දරුණුවන අතර මෙතෙක් එහි ප්‍රමාණය නිමානය කර නොමැත.

"දිත්වා" සුළිකුණාටුව කරුණු කීපයක් මත සුවිශේෂී වෙයි. නිරීක්ෂණ දත්ත අනුව මෙය පැය 12කට වඩා අඩු කාලයකින් පීඩන අවපාතයේ සිට සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීම ඉන් එක් කරුණකි. ගෝලීය උණුසුම ඉහළ යාම මත සිදුව ඇති දේශගුණ විපර්යාස හේතුවෙන් ලෝකයේ විවිධ සාගර කලාපවල සීඝ්‍ර වර්ධන (Rapid Intensifying) සුළිකුණාටු තත්ත්වයන් සුලබ වෙමින් පවතින බව කාලගුණ විද්‍යාඥයින් විසින් සනාථ කරමින් සිටී. මෙම තත්ත්වය බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ විද්‍යාමාන වූ එවැනි අවස්ථාවකට සමානකමක් දක්වයි. තවත් කරුණක් වන්නේ මෙම පද්ධතිය පොතුවිල් සිට ගොඩබිම හරහා ගමන් කලත් දුර්වල නොවීම. සාමාන්‍යයෙන් සුළිකුණාටුවක වර්ධනයට දායකවන ශක්තිය සැපයෙන්නේ උණුසුම් මුහුදු ජලයෙන්. සුළිකුණාටුවක් ගොඩබිමකට පැමිණිවිට එය දුර්වල වන්නේ එබැවින්. කෙසේ වෙතත් මෙම පද්ධතිය ගොඩබිම මතින්, මුහුදට සමාන්තරව, උතුරට ගමන් කිරීම එය දුර්වල නොවී පැවතීමට හේතුවක් ලෙස දකින්න පුළුවන් උවත් එය වඩාත් විරළ තත්ත්වයක් වෙයි. දිත්වා නිර්මාණය ආරම්භයේ සිට එහි ගමන් වේගය නිරීක්ෂණය කිරීමේදී සාමාන්‍ය වේගයට සාපේක්ෂව ඉතා සෙමින් ගමන් කිරීම විසින් දිවයින තුළ අධික වැසි තත්ත්වයන් වැඩි කාලයක් තිස්සේ ලැබීමට දායක වී ඇති අතර එම කරුණත් සුවිශේෂී වෙයි.

ශ්‍රී ලංකාවට බලපානු ලබන විවිධ කාලගුණික සංසිද්ධි සහ විශේෂයෙන් අඩුපීඩන තත්ව, පීඩන අවපාත සහ සුළි කුණාටු පිළිබද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ජනතාව දැනුවත් කරනුලබන අතර පැය විසිහතර පුරා ක්‍රියාත්මක වෙයි. ලෝක කාලගුණ සංගමය සහ ආසියා පැසිපික් ආර්ථික සහ සමාජීය කොමිසමේ (Economic and Social Commission for Asia and the Pacific (ESCAP) and the World Meteorological Organization (WMO)) මැදිහත් වීම මත උතුරු ඉන්දියන් සාගරයේ බෙංගාල බොක්ක සහ අරාබි මුහුදු කලාප ආශ්‍රිතව සුළිකුණාටු බලපෑම් ඇතිවන රටවල් සඳහා තාක්ෂණික සහය ලබා දීමට, කලාපීය විශේෂඥ ආයතනයක් (Regional Specialized Meteorological Center for Tropical Cyclones Over North Indian Ocean - RSMC) ඉන්දියාවේ පිහිටුවන ලදී. මෙම ආයතනය, සුළිකුණාටුවක ආරම්භක අවස්ථාවේ සිට අවසානය වනතෙක් එහි බලපෑම් ඇතිවන රටවල් සමග සමීපව ක්‍රියාත්මක වෙමින් යාවත්කාලීන දත්ත යොදාගෙන තොරතුරු නිකුත් කිරීම් සිදු කරයි. මීට අමතරව වර්ථමාන ලෝකයේ පවතින වඩාත් නිවැරදි බවට ප්‍රමුඛ පෙලේ කාලගුණික අංශ මගින් සනාථකල ගණිතමය ආකෘති පුරෝකථන දත්ත අපගේ විශ්ලේශනයන් සඳහා යොදා ගනී.

නිවර්තන කාලගුණික සංසිද්ධි ඒවායේ ස්වභාවය අනුව පෙර හඳුනාගැනීමේ කාල පරාසයන් විචලනය වෙයි. මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයෙන් නිර්මිත සංකීර්ණ භූ විෂමතා ලක්ෂණ සහ සාපේක්ෂව කුඩා දිවයිනක් වටකොටගත් විශාල මුහුදු ප්‍රදේශය නිසාත් වායුගෝලය නිරන්තර වෙනස්කම්වලට ලක්වීම හේතුවෙන් අනාවැකිකරණය අභියෝගාත්මක වන

Hony. President : ***Mr.Malith Fernando***
Hony. Gen. Secretary: ***Mr. S. Wickramasuriya***
Hony. Asst. Secretary: ***Ms. C. G. Premachandra***

Department of Meteorology
383, Bauddhaloka Mawatha
Colombo 7.

Telephone: **011 2252721, 070 3753311, Fax**: **011 2252319**

අතර මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ඇතිවී තිබෙන ගෝලීය උණුසුම ඉහල යාම නිසා මෙම තත්ත්වයන් තවදුරටත් සංකීර්ණ වී ඇත. ඒ අනුව ඇතැම් කාලගුණික වෙනස්කම් සතියකට පමණ පෙර හඳුනා ගත හැකිවුවත් ඇතැම් අවස්ථා වඩාත් කෙටි පෙර හඳුනාගැනීම් සහිත වෙයි.

කෙසේ වෙතත්, බෙංගාල බොක්ක සහ අරාබි මුහුද ආශ්‍රිතව පැනනගින වායුගෝලීය කැළඹිලි, අඩුපීඩන කලාප, පීඩන අවපාත සහ සුළිකුණාටු පිළිබඳව අවධානය යොමු කිරීමේදී, විශේෂයෙන් එහි මූලික අවස්ථාව වන “අඩු පීඩන කලාපය” ඇතිවීමට දින කිහිපයකට පෙර හඳුනාගැනීමක් සිදුකල හැකි වෙයි. මෙම හඳුනා ගැනීම සඳහා RSMC හි සහය නොමදව ලැබෙන අතර කාලගුණ විද්‍යාඥයින් ලෙස දේශීය දත්ත සහ RSMC මගින් ලබාදෙන දත්ත වගේම ගෝලීය දත්ත පදනම් කරගනිමින් සිදුකරන විශ්ලේෂණ අවසානයේ එම පද්ධතීන්ගේ ස්වභාවය හඳුනා ගනී. සාමාන්‍යයෙන් මුහුදු ප්‍රදේශවල වර්ධනය වන කැළඹිලි ස්වභාවයන් සියල්ල සුළිකුණාටු බවට පත්නොවන අතර කැළඹිලි ස්වභාවය හඳුනා ගන්නා මොහොතේදී එය සුළිකුණාටුවක් දක්වා වර්ධනය වන්නේද? නොවන්නේද? යන්න හඳුනාගැනීමත් අවිනිශ්චිත වෙයි. නමුත් අදාළ පද්ධතියේ වර්ධනය හෝ දුර්වල වීම පියවරෙන් පියවර, ඉහල නිරවද්‍යතාවකින් හඳුනා ගැනීමට හැකියි.

ජාතික කාලගුණ මධ්‍යස්ථානය විසින් නිකුත් කරනු ලබන නිවේදන ජාත්‍යන්තර ප්‍රමිතිය අනුව නිකුත් කරනු ලබයි. මෙලෙස නිකුත්කරන නිවේදන සඳහා වර්ණ කේතයක් ඇති අතර එහි "සුදු" වර්ණයෙන් නිකුත් වනුයේ තොරතුරු නිවේදනයකි. මෙවැනි නිවේදනයක් ලද පරිශීලකයා නවතම තොරතුරු ගැන දැනුවත් වීම ප්‍රමාණවත් වෙයි. "ඇම්බර්" වර්ණයෙන් "අවවාදාත්මක" නිවේදන නිකුත්වන අතර අදාළ අවස්ථාව සම්බන්දව ලැබෙන උපදෙස් අනුව සූදානම් වීම අවශ්‍ය වෙයි. අවදානම් ක්‍රියාකාරකම් වලින් ඈත් වී සිටිය යුතු වෙයි. "රතු" නිවේදනයක් යනු අවදානම ගැන නිකුත්කරන උපරිම අවස්ථාව වන අතර මෙය "අනතුරු ඇඟවීමක්" වෙයි. මෙවැනි බොහෝ නිවේදන "ජීවිත අවදානමක් සහිතවීම" සම්බන්ධයෙන් වන බැවින් වහාම ක්‍රියාත්මක විය යුතුවෙයි. මහජනතාව සහ අපදා කළමනාකරණයේ පාර්ශවකරුවන් (Stakeholders in Disaster Management) වෙත මෙම තොරතුරු වඩාත් ඉක්මනින් ලබාදීම ජාතික කාලගුණ මධ්‍යස්ථානයේ කාලගුණ විද්‍යාඥයින්ගේ රාජකාරිය වෙයි. මෙවැනි නිවේදනයක් ලද සැනින් පාර්ශවකරුවන් සතුව, එක් එක් නිවේදනයේ ඇති තොරතුරේ ස්වභාවය අනුව ක්‍රියාත්මකවන නිශ්චිත ක්‍රියාත්මකවීමේ කාර්ය පටිපාටීන් (Standard Operating Procedures - SOPs) ඇති අතර ඒ අනුව ක්‍රියාත්මක විය යුතු වෙයි.

“දිත්වා” සුළිකුණාටුව නිර්මාණය වීමට හේතුවූ වායුගෝලීය කැළඹිලි ස්වභාවය අපගේ විද්‍යාඥයින් විසින් ප්‍රථමවරට හඳුනාගැනීම සිදු කරනුයේ නොවැම්බර් 23 වන අතර එදිනම, එම තොරතුරු යුහුසුළුව ධීවර සහ නාවුක ප්‍රජාව වෙත නිකුත් කරමින්, එළඹෙන “නොවැම්බර් 25 දින දිවයින ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් නිර්මාණය විය හැකි” බව දැනුම් දී ඇත.

නොවැම්බර් 24 දිනදී ඒ වනවිට දිවයිනෙන් වඩාත් ඈත මලක්කා සමුද්‍ර සන්දිය ආසන්නයේ පැවති පද්ධතියේ නව තොරතුරු සමගින් මුහුදු ප්‍රදේශ වෙත "ඇම්බර්" වර්ණයෙන් යුත් අවවාදාත්මක නිවේදනය යාවත්කාලීන කර ඇත. මීට අමතරව නොවැම්බර් 24 දිනයේදී, ඉදිරි කාලයේ පැවතිය හැකි නව කාලගුණික තත්ත්වයන් සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ හමුවක්ද පැවැත්විණි.

පෙර නිකුත්කළ නිවේදනය සනාථ කරමින් 2025-11-25 දින උදෑසන අඩුපීඩන කලාපය නිර්මාණය විණි. ඒ අනුව නොවැම්බර් 25 උදෑසන 10.00ට දිවයින ආශ්‍රිත අඩු පීඩන කලාපය ගැන "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනයක් නිකුත් කර ඇත. ඉන් පසුව සවස 03.45ට, නිර්මාණය වී තිබෙන අඩු පීඩන කලාපයේ බලපෑමෙන් දිවයිනේ නැගෙනහිර ඌව මධ්‍යම පළාත් සහ පොළොන්නරු දිස්ත්‍රික්කය සඳහා මිලිමීටර් 150ට වැඩි ඉතා තද වැසි ලැබිය හැකි බව සඳහන් කරමින් "රතු" වර්ණයෙන් යුත්, ඉතා තද වැසි සඳහා පළමු "අනතුරු ඇඟවීමේ" නිවේදනය නිකුත් කරන ලදී. **මෙය "දිත්වා"** පද්ධතියේ මූලික අවස්ථාව සඳහා නිකුත්කළ පළමු **"රතු" අනතුරු ඇඟවීමේ නිවේදනයයි.** රාත්‍රී 10.30ට මෙම රතු අනතුරු ඇඟවීමේ නිවේදනය ගොඩබිම සහ මුහුදු ප්‍රදේශ ආවරණය වනපරිදි යාවත්කාලීන කරන ලදී.

නොවැම්බර් 26 සිට, ඒ වනවිට නිකුත්කර තිබූ රතු නිවේදනය, නවතම දත්ත සමගින් යාවත්කාලීන කර ඇත. මෙහිදී ජාතික කාලගුණ මධ්‍යස්ථානයේ විද්‍යාඥයින් විසින් මෙවැනි අවස්ථාවක අනුගමනය කරන SOP අනුව ක්‍රියාත්මක විණි. නොවැම්බර් 26 දින තවදුරටත් ගොඩබිම සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා රතු අනතුරු ඇඟවීමේ නිවේදනය උදෑසන 10.30ට සහ රාත්‍රී 10.30ට ලෙස දෙවතාවක් යාවත්කාලීන කරන ලදී. නිර්මාණය වූ අඩු පීඩන කලාපය ඉදිරි

Hony. President : ***Mr.Malith Fernando***
Hony. Gen. Secretary: ***Mr. S. Wickramasuriya***
Hony. Asst. Secretary: ***Ms. C. G. Premachandra***

Department of Meteorology
383, Bauddhaloka Mawatha
Colombo 7.

Telephone: **011 2252721, 070 3753311, Fax**: **011 2252319**


---

පැය 30 තුල පීඩන අවපාතයක් දක්වා වර්ධනය වියහැකි බවත් එහි බලපෑම හේතුවෙන් දිවයිනේ වැසි සහ සුළං තත්ත්වයේ වැඩි වීමක් ඉදිරි දින කිහිපයේදීත් බලාපොරොත්තු වන බවත් දැනුම් දී ඇත. නොවැම්බර් 26 දින සිට නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දී ඇත. මෙම දින නැවත වතාවක් නව දත්ත අනුව, නිර්මාණය වියහැකි තත්ත්වයන් සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කිරීම සිදුකරන ලදී.

සාමාන්‍ය තත්ත්ව යටතේ කා.වි.දෙ. ප්‍රාදේශීය නිරීක්ෂණ මධ්‍යස්ථාන මගින් පැය තුනෙන් තුනට කාලගුණික නිරීක්ෂණ සිදු කරන නමුත් නොවැම්බර් 26 උදෑසන 10.30 සිට නොවැම්බර් 29 දින දක්වා මෙම පද්ධතියේ වර්ධනය සම්බන්ධ කාලගුණික දත්ත ලබාගැනීම වෙනුවෙන් ගාල්ල, හම්බන්තොට, පොතුවිල්, ත්‍රිකුණාමලය සහ යාපනය පිහිටි නිරීක්ෂණ මධ්‍යස්ථානවල පැයෙන් පැයට නිරීක්ෂණ සිදු කරන ලදී.

අඩුපීඩන කලාපය, පීඩන අවපාතය දක්වා වර්ධනය වීම නොවැම්බර් 27 උදෑසන 8.30ට දැනුම් දෙමින් මිලිමීටර් 200ට වඩා ඉතා තද වැසි පුරෝකථනය කර ඇති අතර දිවයිනේ සෑම දිස්ත්‍රික්කයකම අවදානම් සහිත (High Risk Level) වැසි ඇතිවිය හැකි බව නිවේදනය කර ඇත. පීඩන අවපාතය, ගැඹුරු පීඩන අවපාතය දක්වා වර්ධනය වීමේ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය දහවල් 1.00ට නිකුත් කර ඇත. මෙදිනම සවස 5.00 වනවිට නව දත්ත අනුව ගැඹුරු පීඩන අවපාතය, "දිත්වා" සුළිකුණාටුව දක්වා වර්ධනය වීමේ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කර ඇත. නොවැම්බර් 27 දින නැවතවරක් නවතම තත්ත්වයන් සම්බන්ධයෙන් පාර්ශවකරුවන් දැනුවත් කර ඇත.

සුළිකුණාටු සඳහාවන SOP හි ක්‍රමවේදය අනුව ඉන් පසුව සෑම පැය තුනකටම වතාවක් නව තත්ත්වයන් දැනුම් දෙමින් 2025-11-30 දිනය දක්වා රතු නිවේදන 25ක් යාවත්කාලීන කර ඇත.

චන්ද්‍රිකා නිරීක්ෂණ දත්ත සහ දේශීය දත්ත අනුව නොවැම්බර් 30 සවස්කාලය වනවිට "දිත්වා" සුළි කුණාටුව දිවයිනෙන් වඩාත් බැහැරට යමින් පැවති අතර එදින රාත්‍රී 09.00ට නිකුත් කරනලද "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනය මගින් ඒ වනතෙක් දිවයිනේ පැවති අවදානම් ස්වභාවය අඩුවූ බව දැනුම් දෙන ලදී.

දෙසැම්බර් 01 දින "දිත්වා" සුළි කුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වූ අතර මෙම දිනයේදීත් පැය 6කට වරක් බැගින් "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදන තුනක් යාවත්කාලීන කරමින් නව තොරතුරු නිකුත් කර ඇත. මෙම පද්ධතියේ අවසන් නිවේදනය, නිවේදන අංක 36 යටතේ දෙසැම්බර් 03 දින සවස 4.30ට නිකුත්කර ඇත.

පසු සුළිකුණාටු තත්වයන් හමුවේ විවිධාකාර අසත්‍ය සහ නිවැරදි නොවන අර්ථ නිරූපණ සහිත මාධ්‍ය වාර්තා උපුටා දක්වමින් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යාඥයින් සිදුකරණ ලද සමස්ථ කාර්යභාරය සම්බන්ධයෙන් කිසිදු දැනුවත්භාවයකින් තොරව සමාජ මාධ්‍ය හරහා ඇතැම් චෝදනා යොමු විණි. ඒ අතර ප්‍රධාන චෝදනා දෙකක් නම්, *"BBC මාධ්‍ය මගින් 25 වෙනිදා මිලිමීටර් 500ක වැස්සක් පුරෝකථනය කරා කා.වි.දෙ. කිව්වෙ 150යි". මාද්‍ය වාර්තාවක් යොදා ගනිමින් "ඉන්දීය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (IMD) දිත්වා ගැන 13 සිට අනතුරු ඇඟවීම් සිදුකරා"*. ප්‍රථම චෝදනාවේ දැක්වෙන BBC මාධ්‍ය විසින් පවසන්නෙ අදාළ දින කිහිපය තුළ ලැබිය හැකි මුළු වර්ෂාපතනයේ එකතුකළ අගය මිලිමීටර් 500ක් පමණ විය හැකි බවයි. කෙසේ වෙතත් ලංකාවෙ වර්ෂාව දැනුම් දෙනුයේ "දිනකට ලැබිය හැකි වර්ෂාපතනය" ලෙසයි. මෙය මූලික වශයෙන් අනාවැකි ක්‍රමවේදය පටලවා ගැනීමක්. ඒ අනුව ලංකාවෙ කා.වි.දෙ. අනාවැකිවල දින කිහිපයේ එකතුකළ වර්ෂාපතන අනාවැකිය මිලිමීටර් 600-800 පමණ අගයක්!

අනෙක් චෝදනාවට පිළිතුරු වශයෙන් IMD විසින් නොවැ. 13 හෝ ඒ අසන්න දිනක දිත්වා සුළිකුණාටුවේ මූලික අවස්ථාව ගැන කිසිදු දැනුම්දීමක් සිදු නොකළ බව අවධාරණය කරමු! මෙය සම්පූර්ණ අසත්‍යයක් වෙයි! සති දෙකකට පමණ පෙර එවැනි නිශ්චිත අනාවැකි පලකල හැකි කිසිදු ක්‍රමවේදයක් ලෝකයේ මේවනතෙක් සොයාගෙන නැත. IMD එසේ නොමැතිනම් RSMC විසින් ප්‍රථම වතාවට මෙම පද්ධතියේ මූලික අවස්ථාව ගැන නිල වශයෙන් දැනුම් දෙනු ලැබුවේ 2025-11-23 දින සවස 2.30ට නිකුත්කළ නිවේදනයෙනි. මෙම තොරතුරු දේශීය සහ ගෝලීය දත්ත සමග තවදුරටත් තහවුරු කරගැනීමෙන් පසුව හවස 4.00ට කා.වි.දෙ. විසින් නිල වශයෙන් දැනුම්දෙන ලදී. සුළි කුණාටුවේ ආරම්භය RSMC මගින් 2025-11-27 හවස 2.30 නිවේදනය කල අතර කා.වි.දෙ. මගින් සවස 5.00ට නිල වශයෙන් නිවේදනය කරන ලදී.

# Sri Lanka Association of Meteorologists

**(Regd. No. 4327)**

Hony. President : ***Mr.Malith Fernando***
Hony. Gen. Secretary: ***Mr. S. Wickramasuriya***
Hony. Asst. Secretary: ***Ms. C. G. Premachandra***

Department of Meteorology
383, Bauddhaloka Mawatha
Colombo 7.

Telephone: **011 2252721, 070 3753311, Fax**: **011 2252319**

ඉහතින් දක්වා ඇති කරුණු අනුව "දිත්වා" සුළිකුණාටුව වර්ධනය වීමට පෙර සිටම පවතින නිශ්චිත ක්‍රියාත්මක වීමේ පටිපාටිවලට (SOP) අනුකූලව අදාල පාර්ශවකාර ආයතන සහ ජනතාව වෙත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ විද්‍යාඥයින් විසින් නිසි දැනුවත්කිරීම් සහ අනතුරු ඇගවීම් සිදු කල බව අවධාරණය කරමු! මේ හේතුවෙන් ධීවර හා නාවුක ප්‍රජාව මෙම පද්ධතීන් මගින් වූ අවධානමෙන් ගලවා ගැනීමට අවසථාව ලැබිණ. කෙසේ වෙතත් දේශගුණ විපර්යාසයන් හමුවේ වඩාත් අවිනිශ්චිතවන ආන්තික කාලගුණික අවස්ථාවන් හඳුනාගැනීම වෙනුවෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අනතුරු ඇඟවීමේ ක්‍රියාවලිය පවතින තත්ත්වයට වඩා දියුණු කිරීමට අවශ්‍ය බව අපි විශ්වාස කරමු. ඒ වෙනුවෙන් මෙම අපදා අවස්ථාවේ පැවති දුර්වලතා, අප විසින් විස්තරාත්මකව අධ්‍යනය කරමින් පවතින බව දැනුම් දෙමු.

අවසන් වශයෙන් මෙම සුළිකුණාටු අවස්ථාව එහි මූලික අවස්ථාවේ සිට නිසි අයුරින් අනාවැකිකරණය සහ පෙර දැනුම්දීම් සඳහා ගුණාත්මක දත්ත අඛණ්ඩව සැපයීම වෙනුවෙන් අවදානම් ආපදා තත්ත්වයන් මධ්‍යයේ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාලගුණ නිරීක්ෂණ මධ්‍යස්ථානවල සහ කොළඹ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ පැය 24 පුරා සේවය ලබාදුන් නිරීක්ෂක නිලධාරීන් සහ සහයක මහත්ම මහත්මීන් ස්තුතිපූර්වකව සිහිපත් කරමු.

කරුණාකර මේ සම්බන්ධව අමතර නිශ්චිත තොරතුරු සඳහා ඇමුණුම් තුනකින් යුත් අමතර තොරතුරු පරිශීලනය කරන්න.

ස්තුතියි.



උප ලේකම්
ශ්‍රී ලංකා කාලගුණ විද්‍යාඥයින්ගේ සංගමය

ඇමුණුම 01: නොවැම්බර් 23 සිට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ජාතික කාලගුණවිද්‍යා මධ්‍යස්ථානයේ සේවයේ නියුතු කාලගුණ විද්‍යාඥයින් විසින් නිකුත්කරන ලද විශේෂ නිල නිවේදනවල සාරාංශය,

ඇමුණුම 02: නොවැම්බර් 24, 26, 27 පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ හමු

ඇමුණුම 03: අවදානම් තත්ත්වයන් ගැන මහජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය හමු සම්බන්ධ විස්තර

Hony. President : ***Mr.Malith Fernando***
Hony. Gen. Secretary: ***Mr. S. Wickramasuriya***
Hony. Asst. Secretary: ***Ms. C. G. Premachandra***

Department of Meteorology
383, Bauddhaloka Mawatha
Colombo 7.

Telephone: **011 2252721, 070 3753311, Fax: 011 2252319**


**ඇමුණුම 01:**

**2025-11-23 සිට නිල නිවේදන සාරාංශය**

2025-11-23 දින නිකුත්කළ කාලගුණ අනාවැකිය මගින්, නොවැම්බර් මස 25 දින පමණ වන විට ශ්‍රී ලංකාව ට යාබද නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව නව අඩු පීඩන කලාපයක් නිර්මාණය වීමේ හැකියාවක් පවතින බවත් ඒ හේතුවෙන් දිවයින පුරා දැනට පවතින වැසි තත්ත්වය තවදුරටත් ඉදිරි දින කිහිපයේදීත් බලාපොරොත්තු වන බවත් නිවේදනය කරන ලදී. මෙය "දිත්වා" සුළි කුණාටුවේ මූලික අවස්ථාව පිළිබඳ නිවේදනයයි.

මෙදින හවස 4.00ට බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා, සහ දිවයින වටා වන නොගැඹුරු මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ධීවර සහ නාවුක කටයුතුවල යෙදෙන ප්‍රජාව සඳහා තද වැසි/තද සුළන් පිළිබඳව "ඇම්බර්" වර්ණයෙන් අවවාදාත්මක නිවේදනයක් නිකුත් කරන ලදී. මෙම නිවේදනය මගින් දිවයින ආශ්‍රිතව සහ බෙංගාල බොක්ක ප්‍රදේශයේ පැවති පද්ධති ද්විත්වයම ආවරණය වන පරිදි නිවේදනය සැකසිණි.

2025-11-24 බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා, සහ දිවයින වටා වන නොගැඹුරු මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ධීවර සහ නාවුක කටයුතුවල යෙදෙන ප්‍රජාව සඳහා තද වැසි/තද සුළන් පිළිබඳව "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනය යාවත්කාලීන කරන ලදී.

මෙදින නිකුත්කළ කාලගුණ අනාවැකිය මගින්, දිවයින අශ්‍රිතව පවතින පහළ වායුගෝලයේ කැළඹිලි තත්ත්වය 25 දිනයේදී අඩු පීඩන කලාපයක් දක්වා වර්ධනය වීමේ හැකියාව සහ ඒ හේතුවෙන් දිවයින පුරා දැනට පවතින වැසි තත්ත්වය ඉදිරි දින කිහිපයේදී තවදුරටත් බලාපොරොත්තු වනබව දැනුම් දුනිමු.

මුහුදු ප්‍රදේශ සඳහා අනාවැකිය මගින් දකුණු අන්දමන් මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් නිර්මාණය වීමත් එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් 24 දිනයේ ගිනිකොනදිග බෙංගාල බොක්ක ප්‍රදේශයේදී පීඩන අවපාතයක් දක්වා වර්ධනය වීමට ඉඩ ඇති හෙයින් ධීවර සහ නාවික ප්‍රජාව, මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ඉල්ලා සිටිනු ලැබිණි.

2025-11-25 බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශයේ යාත්‍රාකරන බහුදින ධීවර යාත්‍රා සඳහා, සහ දිවයින වටා වන නොගැඹුරු මුහුදු ප්‍රදේශ ආශ්‍රිතව ධීවර සහ නාවුක කටයුතුවල යෙදෙන ප්‍රජාව සඳහා නිකුත්කළ වැසි/තද සුළන් පිළිබඳව "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනය යාවත්කාලීන කරන ලදී.

උදෑසන 10.00ට දිවයින ආශ්‍රිත අඩු පීඩන කලාපය ගැන "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනයක් නිකුත් කරන ලදී.

සවස 03.45ට, ඇතිවී තිබෙන අඩු පීඩන කලාපයේ බලපෑමෙන් දිවයිනේ නැගෙනහිර ඌව මධ්‍යම පළාත් සහ පොළොන්නරු දිස්ත්‍රික්කය සඳහා "රතු" වර්ණයෙන් යුත් ඉතා තද වැසි සඳහා පළමු "අනතුරු ඇඟවීමේ" නිවේදනය නිකුත් කරන ලදී. මෙය "දිත්වා" පද්ධතියේ මූලික අවස්ථාව සඳහා නිකුත්කළ පළමු "රතු" අනතුරු ඇඟවීමේ නිවේදනයයි.

රාත්‍රී 10.30ට මෙම රතු අනතුරු ඇඟවීමේ නිවේදනය ගොඩබිම සහ මුහුදු ප්‍රදේශ ආවරණය වනපරිදි යාවත්කාලීන කරන ලදී.

2025-11-26 (මෙතැන් සිට "රතු" නිවේදන යාවත්කාලීන කිරීම සිදුවිය.) ගොඩබිම සහ දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා රතු අනතුරු ඇඟවීමේ නිවේදනය පැය 12ට වරක් බැගින් දෙවතාවක් යාවත්කාලීන කරන ලදී.

මෙදින ගොඩබිම සඳහා අනාවැකිය මගින්, නිරිතදිග බෙංගාල බොක්ක ප්‍රදේශයේ පැවති අඩු පීඩන කලාපයය ඊයේ 25 මධ්‍යම රාත්‍රී පමණ වන විට ශ්‍රී ලංකාවට දකුණු දෙසින් පැවති බවත් එය ඉදිරි පැය 30 තුල පීඩන අවපාතයක් දක්වා

Hony. President : ***Mr.Malith Fernando***
Hony. Gen. Secretary: ***Mr. S. Wickramasuriya***
Hony. Asst. Secretary: ***Ms. C. G. Premachandra***

Department of Meteorology
383, Bauddhaloka Mawatha
Colombo 7.

Telephone: **011 2252721, 070 3753311, Fax**: **011 2252319**


වර්ධනය වියහැකි බවත් එහි බලපෑම හේතුවෙන් දිවයිනේ වැසි සහ සුළං තත්ත්වයේ වැඩි වීමක් ඉදිරි දින කිහිපයේදීත් බලාපොරොත්තු වන බවත් දැනුම් දුනි.

මුහුදු ප්‍රදේශ සඳහා, නොවැම්බර් 26 දින සිට නැවත දැනුම් දෙන තුරු දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබීය.

*මෙදින උදැසන 10.30 සිට නොවැම්බර් 29 දින දක්වා මෙම පද්ධතියේ ගමන් මාර්ගය තහවුරු කරගැනීම සඳහා සහ සෙසු කාලගුණික නිරීක්ෂණ වැඩිදුර ලබාගැනීම වෙනුවෙන් ගාල්ල සිට හම්බන්තොට හරහා යාපනය දක්වා නැගෙනහිර වෙරළබඩ තීරයේ පිහිටි ප්‍රාදේශීය කාලගුණ විද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථානවල පැයෙන් පැයට නිරීක්ෂණ සිදුකරමින් ප්‍රධාන කාර්යාලයට වාර්තා කරන ලදී. (සාමාන්‍ය තත්ත්ව යටතේ පැය තුනෙන් තුනට නිරීක්ෂණ සිදු කරයි)

2025-11-27 අඩුපීඩන කලාපය, පීඩන අවපාතය දක්වා වර්ධනය වීමේ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කරන ලදී.

පීඩන අවපාතය, ගැඹුරු පීඩන අවපාතය දක්වා වර්ධනය වීමේ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කරන ලදී.

සවස 05.00ට ගැඹුරු පීඩන අවපාතය, "දිත්වා" සුළිකුණාටුව දක්වා වර්ධනය වීමේ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය නිකුත් කරන ලදී.

"දිත්වා" සුළි කුණාටුව පිළිබඳ රතු නිවේදනය තවදුරටත් පැය 3කට වරක් බැගින් තුන් වතාවක් යාවත්කාලීන කරන ලදී. මින් පසුව සෑම පැය 3කටම වතාවක් නව තොරතුරු සමගින් රතු නිවේදනය යවත්කාලීන කරන ලදී.

2025-11-28 "දිත්වා" සුළි කුණාටුව පිළිබඳ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය පැය 3කට වරක් බැගින් 08 වතාවක් යාවත්කාලීන කරන ලදී.

2025-11-29 "දිත්වා" සුළි කුණාටුව පිළිබඳ රතු අනතුරු ඇඟවීමේ නිවේදනය පැය 3කට වරක් බැගින් 08 වතාවක් යාවත්කාලීන කරන ලදී.

2025-11-30 "දිත්වා" සුළි කුණාටුව දිවයිනේ වඩාත් බැහැරට යමින් පැවති අතර "රතු අනතුරු ඇඟවීමේ" නිවේදන 06ක් සහ "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදනයක් ලෙස අවදානම් ස්වභාවය පහතට ගෙනෙන ලදී.

2025-12-01 "දිත්වා" සුළි කුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වූ අතර මෙම දිනයේදීත් "ඇම්බර්" වර්ණයෙන් යුතු අවවාදාත්මක නිවේදන තුනක් නිකුත් කරන ලදී.

**ඇමුණුම 02: පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ හමු**

2025 නොවැම්බර් මාසයේ දෙවන අර්ධයේදී බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය සක්‍රීය ලක්ෂණ හේතුවෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සිය අවදානය වඩාත් ඒ කෙරෙහි යොමු කරනලද අතර ඒ වනවිට පැවති උසස්පෙළ විභාගය සහ සක්‍රීය බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ ඇතිවෙමින් පැවති වායුගෝලීය කැළඹිලි, අඩුපීඩන කලාප. පීඩන අවපාත සහ සුළිකුණාටු හේතුවෙන් ආපදා කළමනාකරණ යාන්ත්‍රණයේ පාර්ශවකරුවන් සහ විශේෂයෙන් විභාග දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය යටතේ නොවැම්බර් 24, 26 සහ 27 දිනවලදී විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මෙම අවස්ථාවන්ට පහත දැක්වෙන ආයතනවල නියෝජිතයින් සහභාගී විය.

1. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (සියලුම දිස්ත්‍රික් නියෝජිතයින්)
2. වාර්මාර්ග දෙපාර්තමේන්තුව

3. ජාතික ගොඩනැගිලි පර්යේෂණ මධ්‍යස්ථානය
4. ජල කළමනාකරණ ලේකම් කාර්යාලය
5. විදුලිබල මණ්ඩලය
6. ධීවර දෙපාර්තමේන්තුව
7. විභාග දෙපාර්තමේන්තුව
8. සෞඛ්‍ය අමාත්‍යාංශය
9. ශ්‍රී ලංකා වරාය අධිකාරිය

**ඇමුණුම 03: අවදානම් තත්ත්වයන් ගැන මහජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය හමු**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් ජනතාව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රධාන ආකාර ලෙස වෙබ් අඩවිය, නිල ෆේස්බුක් පිටුව, පැය 24පුරා විවෘත දුරකථන මාර්ගය වගේම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය හැඳින්විය හැකියි. දිවයිනට සහ මුහුදු ප්‍රදේශවලට බලපෑම් ඇතිවන කාලගුණික වෙනස්වීම් සම්බන්ධව නිරන්තර යාවත්කාලීන කිරීම් පිළිබඳව තොරතුරු ඉතා ඉක්මනින් සෑම පුරවැසියෙක් වෙතම ගෙනයාමට මෙම ආකාර සියල්ලම ඉතාමත් ප්‍රයෝජනවත් වෙයි.

| දිනය | කාලගුණ අනාවැකිය ලබා දුන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තු නිලධාරියාගේ නම |
|---|---|
| 2025.11.23 | කාලගුණ විද්‍යාඥ මලිත් ප්‍රනාන්දු මහතා |
| 2025.11.24 | අධ්‍යක්ෂ මෙරිල් මෙන්ඩිස් මහතා |
| 2025.11.25 | අධ්‍යක්ෂ ජනරාල් ඒ.කේ.කරුණානායක මහතා |
| 2025.11.26 | කාලගුණ විද්‍යාඥ නිමල් බණ්ඩාර මහතා |
| 2025.11.27 | අධ්‍යක්ෂ ජනරාල් ඒ.කේ.කරුණානායක මහතා |
| 2025.11.28 | අධ්‍යක්ෂ ජනරාල් ඒ.කේ.කරුණානායක මහතා |